# **<u>විශේෂ නිවේදනයයි.</u>**

**ඊශ්‍රායලයේ වාසය කරන සියළුම ශ්‍රී ලාංකිකයන් වෙත,**

**<u>2021 අයවැය යෝජනා අනුව ශ්‍රී ලංකාව වෙත විදේශ මුදල් යැවීමේදී ලබාදෙන දිරි දීමනාව පිළිබඳව විදේශයන්හි සිටින ශ්‍රී ලාංකික ප්‍රජාව දැනුවත් කිරීම.</u>**

2021 වසරේ අයවැය යෝජනා අනුව විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා වාණිජ බැංකු/බැංකු නියෝජිතායතන හරහා ශ්‍රී ලංකාවට විදේශ මුදල් යැවීමේදී සාමාන්‍ය විනිමය අනුපාතයට වඩා වැඩි ප්‍රමාණයක් දිරි දීමනාවක් ලෙසින් 2020.12.28 වැනි දින සිට අදාල බැංකු ගිණුම් හිමියන් වෙත ලබා දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල වාණිජ බැංකු වෙත උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව, විදේශ රැකියාවක යෙදී සිටින/යෙදී සිට ඇති ඔබ විසින් උපයන ලද විදේශ මුදල් විධිමත් මාර්ගයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා වාණිජ බැංකු/බැංකු නියෝජිතායතන හරහා ශ්‍රී ලංකාවට යැවීමේදී රුපියල් බවට පරිවර්තනය කරනු ලබන සෑම ඇමෙරිකානු ඩොලරයකටම රුපියල් දෙකක (රු.2.00 ක) වැඩිපුර මුදලක් ලබාදීමට අදාල බැංකු විසින් කටයුතු කරනු ලැබේ.

එබැවින්, ඔබ විසින් උපයනු ලබන විදේශ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ඊශ්‍රායලයේ පිහිටි ශ්‍රී ලංකා වාණිජ බැංකු/බැංකු නියෝජිතායතන හරහා ශ්‍රී ලංකාවට යවා ඉහත සඳහන් දිරිදීමනාව ලබාගැනීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ඔබ වෙත දන්වා සිටී.

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලය**
**ටෙල් අවිව්/ඊශ්‍රායලය.**

2021.05.27